**පොල් සංවර්ධන අධිකාරිය - 2024**
**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

පොල් සංවර්ධන අධිකාරියේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ , 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ප්‍රයෝජනවත් ජීව කාලය අවසන් වූ රු.2,096,164 ක දේපල පිරියත හා උපකරණ සම්බන්ධව හෙලිදරව් කිරීමට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 හි 65 වගන්තිය ප්‍රකාරව වත්කමක අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීව කාලය අඩු වශයෙන් සෑම වාර්ෂික වාර්තාකරණ කාලච්ඡේදයක් අවසානයේ සමාලෝචනය කිරීම සහ අපේක්ෂිත තත්ත්වයන් ඇස්තමේන්තුවලින් වෙනස් වේ නම් එම වෙනස ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 – "ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි" ප්‍රකාරව ගිණුම්කරණ ඇස්තමේන්තුවක වෙනසක් ලෙස ගිණුම් ගත කළ යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | 2025 වර්ෂයේ කමිටුවක් පත්කර ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කරනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

**1.5.2 ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2024 වර්ෂය තුළ පැවැත්වූ ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ 60 වන සංවත්සර සැමරුම වෙනුවෙන් 2025 වර්ෂයේදී ගෙවන ලද රු.5,241,800 ක මුදල සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස උපචිත කර නොතිබුණි. | 2024 වර්ෂයේ අනුමත ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිපාදන නොතිබුණු බැවින් මේ සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කර අනුමැතිය ලබාගැනීම සඳහා අදාළ තොරතුරු සවිස්තරාත්මකව සපයන ලෙස දන්වා එවන ලෙස අමාත්‍යාංශ ලේකම්ට 2025-01-02 දින දන්වා යවා තිබුණි.<br>අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළ ලිපිය නිකුත් කර ඇත්තේ 2025-01-08 දින වන අතර අධිකාරිය වෙත ලැබී ඇත්තේ 2025-01-16 දිනය.<br>2025-01-16 දින වන විට 2024-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ | ශේෂපත්‍ර දිනට පසු සිදුවීම් ගිණුම් පිළියෙල කිරීමේදී සැලකිල්ලට ගතයුතු බැවින් නිශ්චිතව හඳුනාගත් වියදම් මූල්‍ය ප්‍රකාශනවල ගැලපිය යුතුයි. |

| | | |
|---|---|---|
| | අවසාන ගිණුම් පිළියෙල කර තිබූ අතර 2024-12-31 දිනට මූල්‍ය ප්‍රගතියද අමාත්‍යාංශය වෙත යවා තිබුණි. | |
| (ආ) ජාත්‍යන්තර පොල් ප්‍රජාවේ 60 වන සංවත්සර සැසිවාරය සඳහා අධිකාරිය විසින් 2024 අගෝස්තු 7 දින අමාත්‍යාංශය වෙත ලබා දී තිබූ රු.7,000,000 ක් වූ වියදමට අදාළ වියදම් විස්තරයක් හා අදාළ බිල්පත් ඉදිරිපත් කර නොතිබූ බැවින් එම වියදමෙහි නිරවද්‍යතාවය තහවුරු කරගත නොහැකි විය. | ගෙවීම් සම්බන්ධ සවිස්තරාත්මක වියදම් වාර්තාව පොල් සංවර්ධන අධිකාරිය වෙත ලබාදෙන ලෙස 2025-01-02 දිනැතිව අමාත්‍යාංශය වෙත යොමුකර ඇතත් 2025-04-29 දින දක්වා ඒ සඳහා පිළිතුරක් ලබාදී නොමැත. | ගෙවීම් වලට අදාල සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි. |
| (ඇ) 2023 දෙසැම්බර් 31 දිනට පැවති හඳුනා නොගත් තැන්පතු ශේෂය රු.2,833,390 ක් සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් හඳුනා ගත් ශේෂයක් ලෙස සලකා වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණ ද ඊට අදාළ විස්තර විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ගිණුම්ගත කිරීම්වල නිරවද්‍යතාවය විගණනයේදී තහවුරු කර ගැනිමට නොහැකි විය. | 2023-12-31 දිනට හඳුනා නොගත් තැන්පතු ලෙස රු.2,833,390/- ක මුදලක් පැවතුනද එම මුදලින් රු.1,340,510/- ක මුදලක් අදාල තැන්පත්කරුවන් හඳුනාගෙන ඉන්වොයිස් පත් නිකුත් කර ගිණුම්ගත කර ඇත. නමුත් මෙම මුදලින් රු.1,492,880.53 ක මුදලක් 2024-12-31 දිනට හඳුනාගෙන නොමැත. | නිශ්චිතව හඳුනා නොගෙන ආදායමට ගැලපීම් නොකළ යුතුයි. |
| (ඈ) රු. 1,250,000 ක විදුලි තැන්පතු මුදල් සඳහා සමුච්චිත වර්ෂයට අදාල රු.312,625 ක් වූ පොලිය ආදායමක් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | විදුලි සම්බන්ධතා සඳහා තබා ඇති තැන්පතු සඳහා පොළී ගෙවීම විදුලිබල මණ්ඩලය විසින් ආරම්භකර ඇත්තේ 2024 අප්‍රේල් මස සිටය. 2025 වසරේ සිට මෙම තැන්පතු සඳහා අදාල පොලිය වෙනම පෙන්වීමට පියවර ගනු ඇත. | විදුලි තැන්පතුව ගිණුම් ගත කිරීමටත් ඒ සඳහා වාර්ෂික පොලිය ගණනය කර වර්ෂයේ ආදායමට ගැනීමටත් කටයුතු කළ යුතු අතර වියදම් සහ ආදායම් හිලව් කිරීමට කටයුතු නොකළ යුතුයි. |
| (ඉ) 2023 වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද රු.2,524,897 ක දේපල පිරියත හා උපකරණ 2024 වර්ෂයේ දී ගිණුම්ගත කර තිබුණද 2023 වර්ෂයට අදාළ රු.252,490 ක් වූ ක්ෂය ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමුච්චිත ක්ෂය ශේෂය අඩුවෙන් දක්වා තිබුණි. | 2025-12-31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන අවසාන ගිණුම් වාර්තාවේ මෙම ක්ෂය ගැලපීම් පෙර වසරේ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනු ඇත. | 2023 පරිත්‍යාග ලෙස ලැබුණු දේපල පිරියත හා උපකරණ ක්ෂය වෙන්කිරීම් පෙර වර්ෂ ගැලපීම් යටතේ සටහන් කළ යුතුයි. |
| (ඊ)නිලධාරිනියකට ගෙවිය යුතු රු.290,460 ක විශ්‍රාම පාරිතෝෂික වටිනාකම ගිණුම්ගතකර නොතිබුණි. | 2025 වසරේ අවසාන ගිණුම් සැකසීමේදී මෙම වෙනස රු.290,460 ක් පෙර වසරේ ගැලපීම් ලෙස ගිණුම්ගත කිරීමට පියවර ගනු ඇත. | වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |
| (උ) 2024 දෙසැම්බර් 31 දිනට දිනට සේවයෙන් ඉවත්ව ගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අධිකාරියට අයවිය | 2025 වසරේ අවසාන ගිණුම් සැකසීමේදී මෙම වෙනස රු.208, 951 ක් පෙර වසරේ ගැලපීම් ලෙස | වියදම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුයි. |

| | |
|---|---|
| යුතු මුදල රු.400,506 ක් වුවත් එය රු.191,555 ක් ලෙස ගිණුම්ගත වීම හේතුවෙන් ලැබිය යුතු වටිනාකම් රු.208,951 ක් අඩුවෙන් දක්වා තිබුණි. | ගිණුම්ගත කිරීමට පියවර ගනු ඇත. |

**1.6 නීති, රීති රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| **නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ)1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 33 (4) වගන්තිය | පොල් පිළිබඳ සෙස් බද්ද පැනවීම, අය කර ගැනීම, ක්‍රියාත්මක කිරීම හා ගෙවීම් කිරීම සඳහා අධිකාරියට අවශ්‍ය සියළු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි වුවද ඒ සම්බන්ධයෙන් කිසිදු නියෝගයක් මේ දක්වා සකස් කර නොතිබුණි. එසේ තිබියදී සෙස් බද්ද මගින් ලැබූ ආදායම සහ අපනයන කරන පොල් වලින් ලැබෙන ආදායමෙන් අරමුදලක් ඇතිකර තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයේ මෝල් හිමියන් නමින් ගිණුම් 58 ක රු.44,544,351 ක ශේෂයක් වූ අතර 2019 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා එම ගිණුම් වලින් රු.12,442,516 ක මුදලක් එම මෝල් හිමියන් වෙත ආපසු ගෙවා තිබුණි. | "දිසිදි පොල් කර්මාන්තශාලා සංවර්ධනය අරමුදල හා සේවක සහන වේතන අරමුදල යන අරමුදල් දෙක ඒකාබද්ධ කිරීමටත්, එමගින් අර්ථදායි දිරිගැන්වීම් සඳහා නිෂ්පාදකයින්ට ඉඩ සැලසීමත් අරමුණු කරගෙන 1987.07.01 දින සිට නව අරමුදල පිහිටුවනු ලබන බව දක්වා ඇත. මීට අමතරව, වසර 40කට පමණ පෙර ආරම්භ කරන ලද මෙම අරමුදල ස්ථාපිත කිරීමේ නීතිමය ප්‍රතිපාදනය පිළිබඳව තොරතුරු කිසිවක් අධිකාරියේ පැරණි ලිපි ලේඛන වලින් සොයා ගැනීමට නොහැකිවී ඇත. | අවශ්‍ය නියෝග සෑදිමකින් තොරව වියදම් නොදැරිය යුතුයි. |
| (ආ) 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 20 (ඒ) වගන්තිය | ශ්‍රී ලංකාව තුළ නිෂ්පාදනය කරනු ලබන හෝ ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන පොල් නිෂ්පාදනවල ගුණාත්මක තත්ත්වයන් නියම කිරීම හා පවත්වාගෙන යාම අධිකාරිය විසින් සිදු කළ හැකි වුවත් ඇසුරුමක් රහිතව දේශීය වෙළඳපළට ඉදිරිපත් කරන පොල්තෙල් වල ගුණාත්මකභාවය ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය නීතිමය පියවර ගැනීමට අවශ්‍ය | පිළිතුරු ලබා දී නොමැත. | ඇසුරුම් රහිතව පොල් තෙල් වෙළඳපලට පැමිණීම වැළැක්වීමට නීති සම්පාදනය කළ යුතුයි. |

| | | |
|---|---|---|
| | නියෝග සකස් කිරීමට අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව අනුව නාගරික ප්‍රදේශවලින් බැහැරව ග්‍රාමීය ප්‍රදේශ වල අලෙවි කරන පොල්තෙල් නියාමනය නොකිරීම හේතුවෙන් ඒවායේ ඇෆ්ලටොක්සීන් අඩංගු වීම පිළිබඳ අනතුරු හඟවා තිබුණි. ඒ පිළිබඳ අවධානය යොමු කර නොතිබූ අතර ඇසුරුමක් රහිත පොල්තෙල් වෙළඳපලට පැමිණීම වැළැක්වීමට නියෝගයක් මඟින් නීතිමය පියවර ගතහැකි වුවද අධිකාරිය විසින් එසේ සිදුකර නොතිබුණි. | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 184,152,635 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපි ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 170,788,322 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 13,364,313 ක වර්ධනයක් නිරීක්ෂණය විය. පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ පරීක්ෂණාගාර අදායම, නැවුම් පොල් ක්ෂේත්‍ර පරීක්ෂණ හා සැකසුම් ගාස්තු ආදායම, බහාලුම් පරීක්ෂණ ආදායම පිළිවෙලින් රු.21,581,805 ක්, රු.29,648,650 ක්, රු.4,290,386 ක් ඉහළ යාමද තත්ත්ව පාලනය හා ගුණත්ව සහතිකකරණ අංශයේ ප්‍රාග්ධන සංවර්ධන වියදම් රු.3,628,715 කින් අඩුවීමද මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය.

### 2.2 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 6:1 ක් හා 5.1 ක් වූ අතර පසුගිය වර්ෂයේදී එම අනුපාතයන් 5:1 ක් හා 5.1 ක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) පොල් නිෂ්පාදන මිල අඩු වැඩි වීම මත වෙළඳපලට පොල් නිෂ්පාදන නිකුත් කිරීමේ මිල ස්ථායීකරණය කිරීම සඳහා අරමුදලක් ආරම්භ කර තිබුණද මෙවැනි අරමුදලක් ඇති කිරීමට ව්‍යවස්ථාපිත නියෝගයක් නිකුත් කර තිබූ බවක් නිරීක්ෂණය නොවුණි. සමාලෝචිත වර්ෂයේදී | මෙම අරමුදලේ ආරම්භය සම්බන්ධව අධිකාරිය සතුව ලිඛිත තොරතුරු නොමැත. අමාත්‍යාංශ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී මේ පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පිහිටුවා කමිටු තීරණය ලබාදෙන ලෙසට උපදෙස් ලබාදෙන ලදී. අධිකාරියේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ | ව්‍යවස්ථාපිත නියෝග අනුව අරමුදල් ආරම්භ කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව මෙම අරමුදලේ ශේෂය රු.439,620,170 ක් වූ අතර අරමුදල පිහිටුවීමේ මූලික අරමුණද මේ දක්වා ක්‍රියාත්මක වී නොතිබුණි. | තනතුරේ නිලධාරීන් තුන් දෙනෙක්, වැවිලි අමාත්‍යාංශයේ නිලධාරියෙක්, මහා භාණ්ඩාගාරයේ නිලධාරියෙක් මෙම කමිටුවට පත්කර ඉදිරි කටයුතු සිදුකරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය උපදෙස් ලබාදී ඇත. මහා භාණ්ඩාගාරයේ නිලධාරියෙක් නම්කර එවූ පසු කමිටුව රැස්වී මේ පිළිබඳව කමිටු තීරණය දැනුම් දීමට නියමිතය. | |
| (ආ) | අපනයනය සඳහා වූ තාවකාලික ආනයන ක්‍රියාවලියේදී (TEIP) අගය එකතු කර නැවත අපනයනය කිරීමේදී අධිකාරිය නියැදි පරීක්ෂාවක් සිදු කරන අතර රසායනාගාර පරීක්ෂණ වාර්තා ලබා දීමට ප්‍රථම එම ප්‍රතිඅපනයන ක්‍රියාවලිය සම්පූර්ණ වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 2 දක්වා බොර පොල්තෙල්, RBD, පොල් සීනි, පොල් වතුර යන නිෂ්පාදිත හතරකට අදාළව කිලෝ ග්‍රෑම් 3,525,648 ක් ප්‍රතිඅපනයනය කිරීමට පරීක්ෂණ වාර්තා ලැබීමට පෙර අධිකාරිය විසින් අනුමැතිය ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂයේ එවැනි පරීක්ෂා කිරීම් 164 ක් සිදු කර තිබූ අතර එහි වාර්තාවන් ඉදිරිපත් කිරීම සඳහා මාස 1 ත් මාස 3 ත් අතර කාල පරාසයක් ගත වී තිබුණි. රසායනාගාර වාර්තා ලබාදීමට පෙර ප්‍රතිඅපනයනයට අවසර දීම මත පොල් නිෂ්පාදනය කෙරෙහි ජනතා විශ්වාසය බිඳීයාමේ අවධානමක් නිරීක්ෂණය විය. | ප්‍රති අපනයන ක්‍රියාවලියේදී රට තුලට ලබාගන්නා මෙම තොග ප්‍රති අපනයනය කිරීම සඳහා සකස් කළ නිෂ්පාදන අධිකාරියේ පරීක්ෂකවරයකු විසින් ආදර්ශයන් ලබාගෙන රසායනාගාර පරීක්ෂාවන් සඳහා යොමු කරන අතර එම ආදර්ශ සඳහා ප්‍රතිඵල නිකුත් කිරීමට ද යම් කිසි කාල සීමාවක් ගත වේ. අදාළ අපනයනය සම්බන්ධ රසායනාගාර ප්‍රතිඵල නිකුත් කරන තෙක් රට තුල රඳවා තබා ගැනීමේදී අදාළ අපනයකරුට ඒ සඳහා වියදමක් දැරීමට සිදු වන අතරම, නිශ්චිත දිනයට අපනයන සිදු කිරීමට නොහැකි වුවහොත් අපනයනකරුගේ ගැනුම්කරුවන් අහිමි වී යාමේ හැකියාවක් ද පවතී.<br>ඒ නිසා අපනයනකරුවන් සඳහා පොල් සංවර්ධන අධිකාරිය විසින් පෙර අපනයන වාර්තාවන් සලකා බලා එම ප්‍රතිරූපය ප්‍රකාරව (Green Channel Concept) අපනයනකරුගේ පහසුව හා එමගින් රටට ලැබෙන අපනයන ආදායමද යන කරුණු සලකා බලා, රසායනාගාර වාර්තා නිකුත් කිරීමට පෙර ප්‍රති අපනයනය සඳහා අධිකාරිය No objection ලිපි නිකුත් කරනු ලැබේ. No objection ලිපි නිකුත් කළද ආදර්ශ ලබාගැනීම අත්‍යවශ්‍ය කරුණකි. විශ්ලේෂණ වාර්තාවල යම් ගැටලුකාරී තත්වයක් පවතී නම්, ඉදිරි කාලවලදී එම ආයතනයේ අපනයනයවන බහාලුම්, විශ්ලේෂණ ප්‍රතිඵල මත පමණක් පදනම්ව අපනයනයට අවසර දීම සිදු කරනු ලබයි. | අපනයනයට පෙර රසායනාගාර වාර්තාව ලැබෙන පරිදි රසායනාගාර සේවාව කඩිනම් කිරීමටත් දවසේ පැය 24 පුරාම සේවා ලබාගත හැකිවන පරිදි රසායනාගාර සේවා පුළුල් කළ යුතුයි. |
| (ඇ) | කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකාරිය, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව සමඟ එළඹී අවබෝධතා ගිවිසුමේ 3.3 වගන්තිය ප්‍රකාරව කාරක ණය ගිණුමේ උපරිමය රු.මිලියන 10 කට සීමා වන අතර අතිරික්ත මුදල් ස්ථාවර තැන්පතු | කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමය යටතේ ණය ඉල්ලුම්කරුවන් සඳහා ණය මුදල් නිදහස් කිරීමට බැංකුව වෙත අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල් සහ අධ්‍යක්ෂ (මුදල්) යන තිදෙනාගේ අත්සන් වලින් යුත් ලිපි අදාළ බැංකුව වෙත ලබාදිය යුතුය. 2024 මැයි මස සිට අධ්‍යක්ෂ ජනරාල් තනතුර පුරප්පාඩුව | තනතුරු පුරප්පාඩු වීමත් සමග එසේ අත්සන් තැබීමට බලය පවරන නිලධාරීන් නැවත වරක් නම් කිරීමට කළමනාකාරිත්වය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ගිණුමට මාරු කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාරක ණය ගිණුමේ රු.30,888,823 ක ශේෂයක් පැවතියද රු.20,888,823 ක් වූ අතිරික්තය ස්ථාවර තැන්පතු තුල ආයෝජනය කිරීමට අධිකාරිය විසින් පියවර ගෙන නොතිබුණි. | පැවති බැවින් මෙම ලිපි බැංකුව වෙත යැවීමට නොහැකි වී තිබිණි. එහෙත් නව සභාපති පත්වීමත් සමඟම අදාළ ලිපි සභාපති සහ අධ්‍යක්ෂ (මුදල්) අත්සනින් යුතුව 2024 දෙසැම්බර් මස ප්‍රාදේශීය සංවර්ධන බැංකුව වෙත යවන ලදී. එහි වටිනාකම රුපියල් මිලියන 30.3 කි. එබැවින් අදාළ මුදල් ස්ථාවර තැන්පතු වල ආයෝජනය කිරීම සිදු නොකරන ලදී. | |
| (ඇ) 2024 නොවැම්බර් 30 දින වන විට දුන්කන්නාව වත්තේ පොල් වගාව ආශ්‍රිතව සියලුම ඵල දරන ගස් වැඩි ප්‍රමාණයක් සුදු මැස්සා හානියට ලක්ව තිබුණු අතර මෙම රෝගය පළමු වරට 2022 ඔක්තෝබර් මාසයේදී හඳුනාගෙන තිබුණි. මේ සම්බන්ධව අවස්ථා දෙකකදී පාලන ක්‍රියාමාර්ග ගෙන තිබුණ ද 2023 අප්‍රේල් මාසයෙන් පසු විගණිත දින දක්වා සුදුමැස්සා හානිය වළක්වාලීමට නොහැකි වී තිබුණි. | සුදු මැස්සා හානිය මූලික අවධියේදීම හඳුනාගෙන හානිය පාලනය කිරීම සඳහා 2022 දී පොල් පර්යේෂණ ආයතනය මගින් නිර්දේශිතව තිබූ රසායනික මර්ධන ක්‍රමය අප විසින් කඩිනමින් සිදුකරන ලදී. එමෙන්ම 2023 වර්ෂයේ දී ද සුදු මැස්සා පාලනයට ක්‍රියාමාර්ග ගන්නාලදී. රසායනික ද්‍රව්‍ය යොදා දින කිහිපයක් තුල එහි සාර්ථකත්වය පරික්ෂා කල නොහැකිය. ගහන ඝනත්වය පිලිබඳ යම් කාලයක් අධ්‍යයන කල යුතුය. රසායනික ද්‍රව්‍ය මගින් සුදු මැස්සා හානිය පාලනයට අපහසු බව නිරීක්ෂණය විය. තවද රසායනික ද්‍රව්‍ය ක්ෂේත්‍රයට එකදිගට යෙදීම් ඉතා අහිතකර වන අතර කොහොඹ තෙල් වැනි ද්‍රව්‍ය උස ගස් සඳහා යෙදීම ප්‍රායෝගිකව සිදුකල නොහැකිය.<br>මේ සඳහා ඇති එකම විකල්පය පරපෝෂී පැකට් යෙදීමයි. එම පර්යේෂණ වල ප්‍රතිපල අනුව පරපෝෂිත පැකට් ලබාගැනීමට මේ වනවිටත් අදාල ආයතන වලට ලිපි යවා ඇත. ඉහත සඳහන් ක්‍රම වලට අමතරව වෙනත් කිසිදු ක්‍රමවේදයක් මේ වනතෙක් නිර්දේශ කර නොමැත. සුදුමැස්සා මර්ධනය කිරීම සඳහා සාර්ථක ක්‍රමවේදයක් මේ වනතෙක් සොයාගෙන නොමැත. | සුදු මැස්සා රෝගය පාලනය කිරීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ඉ) 2023 ජූලි 06 පැවති රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදී අධිකාරිය සඳහා නිර්දේශ 07 ක් ක්‍රියාත්මක කිරීමට නියෝග කර තිබුණද ඉන් පහත සඳහන් නියෝග 5 ක් ක්‍රියාත්මක කිරීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (i) | සවුදි අරාබියේ ගස් බිලියන 50 ක වගා ව්‍යාපෘතියක් සඳහා පොල් ලෙලි අපනයනය කිරීම පිළිබඳ සංයුක්ත සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගැනීම. | 2019 සිට 2024 දක්වා මෙ.ටො. 5,703 ක් අපනයනය කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ii) | පොල් වගාවේ වර්තමාන ගැටළු පිළිබඳ රූපවාහිනී වැඩසටහනක් හරහා දැනුවත් කිරීමට පියවර ගැනීම. | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව විසින් මීට අදාලව වැඩසටහන් 18කින් යුතුව ගුවන් කාලය වෙන්කර රූපවාහිනී විකාශන කාල රාමුව (TV Schedule) 2025.01.20 දිනැතිව පොල් සංවර්ධන අධිකාරිය වෙත යොමු කර තිබුණු අතර පොල් සංවර්ධන අධිකාරිය විසින් එම වැඩසටහන් තුල සිදු කරණ ක්‍රියාකාරකම් සහ සහභාගීවන නිලධාරීන් පිළිබඳ විස්තර රූපවාහිනියට දන්වා යවා තිබූ අතර 2025.02.17 දින සිට සිදු කිරීමට සැලසුම් කර තිබුණි.<br>ඊට අදාළව අනුමැතිය ලබා දෙමින් පොල් සංවර්ධන අධිකාරිය විසින් සකස්කළ අදාල සවිස්තර වාර්තාව 2025.02.13 දිනැතිව රූපවාහිනී සංස්ථා සභාපති වෙත යොමු කර ඇත. නමුත් මෙහිදී නොවැලක්විය හැකි හේතුවක් මත සැලසුම් කර තිබූ විකාශන කාලරාමු වෙනස් කර ඇති බව වාචිකව දන්වා ඇති අතර ඊට අදාල නව කාල රාමුව පොල් සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කරන ලදි.<br>වැඩසටහන් කාල රාමුව පොල් සංවර්ධන අධිකාරිය වෙත 2025.02.21 දින නැවත වරක් මේ පිළිබඳ විමසා රූපවාහිනී සංස්ථාව වෙත ලිපියක් යොමුකළ ද මේ දක්වා ඒ සඳහා ප්‍රතිචාර දක්වා නොමැත.<br>මෙම තත්වය පිළිබඳ ජනමාධ්‍ය අමාත්‍යාංශ ලේකම් සමඟ සාකච්ඡාවක් පැවැත්වීමට කටයුතු සිදු කරමින් පවතී. | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (iii) | දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය පිළිබඳ වාර්තාවක් මසක් තුළ රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට ලබා දීම. | ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය විසින් යන්ත්‍ර සඳහා තක්සේරු වාර්තාවක් ලබා දී තිබුණද ඒ සඳහා නිර්දේශයක් එම වාර්තාවේ දක්වා නොමැති බැවින් නිර්දේශයන් ලබා ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් පරිදි කමිටුවක් පත් කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (iv) | පොල් සංවර්ධන අධිකාරිය, පාරිභෝගික සේවා අධිකාරිය, සෞඛ්‍ය අමාත්‍යාංශය, වෙළඳ හා | පොල්තෙල් පරීක්ෂා කිරීම පිළිබඳ බලතල කැබිනට් අනුමැතියක් මගින් 2024.08.27 දින ලැබී ඇත. මේ පිළිබඳ | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව හා ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව සමඟ ගුණත්වයෙන් අඩු පොල්තෙල් ආනයනය කිරීම පිළිබඳ සෞඛ්‍යමය ගැටළු සාකච්ඡා කිරීම. | රෙගුලාසියක් කෙටුම්පත් කර නීතිපති වෙත යොමු කර ඇත. | |
| (v)මාර්ගගත ක්‍රමයට ලංසු ඉදිරිපත් කිරීමේ ක්‍රමවේදය ස්ථාපිත කිරීම හා ඒ පිළිබඳ ප්‍රගතිය මාස 3 ක් ඇතුළත රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවට වාර්තා කිරීම. | පොල් වෙන්දේසිය සඳහා සකස්කර ඇති මෘදුකාංගය යාවත්කාලීන කර ගැනීම සඳහා කෝප් කමිටු නිර්දේශ අනුව මොරටුව විශ්ව විද්‍යාලයේ උපකුලපති මහාචාර්ය එන්.ඩී ගුණවර්ධන මහතා වෙත 2023.07.28 වන දින ලිපියක් යවා ඇත. ඉදිරියේදී දිනයක් නියම කර සාකච්ඡාවක් සඳහා පැමිණෙන බවත් වාචිකව දන්වා ඇති නමුත් එය ඉටු නොවූ බැවින් නැවත වරක් 2023.10.12 දින එම සරසවියේ උප කුලපති වෙත ලිපියක් යොමු කර ඇත. | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ)පොල් සංවර්ධන අධිකාරියේ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින ට ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 4 ක් ද මධ්‍යම මට්ටමේ කළමනාකරණ තනතුරු 03 ක් ද කනිෂ්ඨ කළමනාකරණ මට්ටමේ තනතුරු 06 ක් ද පුරප්පාඩුව පැවතුණි. මෙම තනතුරු සඳහා බඳවා ගැනීම් නොකර 2024 වර්ෂයේ නොවැම්බර් දක්වා රාජකාරී ඉටුකිරීම/ වැඩ බැලීම සඳහා පත් කර තිබුණි. | අධ්‍යක්ෂ ජනරාල්- කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි කිරීමට යොමු කර ඇත.<br>අධ්‍යක්ෂ පරිපාලන- සුදුසුකම් සහිත අයදුම්කරුවන් නොමැති වීම මත අමාත්‍යාංශ උපදෙස් පරිදි නැවත දැන්වීම් පළ කර බඳවා ගැනීමට යොමු කර ඇත.<br>අධ්‍යක්ෂ (සැකසුම් හා සංවර්ධන)- කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා යොමු කර ඇත.<br>අධ්‍යක්ෂ අලෙවිකරණ (ජාත්‍යන්තර)- මෙම තනතුර යටපත් කිරීමට කටයුතු කරමින් පවතී.<br>මධ්‍යම කළමණාකරණ මට්ටමේ තනතුරු- පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇත.<br>කණිෂ්ඨ කළමණාකරණ තනතුරු 6- පුරප්පාඩු සම්පූර්ණ කිරීමට අමාත්‍යාංශ අනුමැතිය ඉල්ලා ඇත. | අධිකාරියේ තනතුරු පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන අත්‍යවශ්‍ය පුරප්පාඩු පිරවීමට කළ යුතුයි. |
| (උ)2024 වර්ෂයේදී සේවයෙන් ඉවත් වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අධිකාරිය වෙත අය විය යුතු රු.715,821 ක ණය ශේෂයක් පැවති අතර එය පියවීමකින් තොරව එම නිලධාරීන්ගේ සේවයෙන් ඉවත්වීම | තනුජා සුභාෂිණී මිය සේවයට වාර්තා නොකිරීම මත සේවය හැර ගියාසේ සලකා කටයුතු කර ඇති අතර, එම මහත්මිය විසින් ඇයට හිමි පාරිතෝෂික මුදල මේවනතෙක් ලබා ගෙන නැත. ඒ අනුව එම මහත්මිය විසින් ලබාගත් ණය | පාරිතෝෂික මුදල් ඉවත් කර ගැනීමට පෙර ණය ශේෂ අයකර ගත යුතුයි. |

| | | |
|---|---|---|
| අධිකාරිය විසින් අනුමත කර තිබුණි. | මුදල් අදාල පාරිතෝෂික මුදලින් අයකර ගැනීමට කටයුතු කිරීමට නියමිතය. ඔමේශානි ගමගේ මිය අධිකාරියෙන් ලබා ගත් ආපදා ණය මුදලේ ශේෂයෙන් රු.10000/- වාරික වශයෙන් ගෙවීම් කිරීමට එකග වි ඇති අතර, 2025 අප්‍රේල් මස රු.10000/- අධිකාරියට ගෙවීම් කර ඇත. රොෂාන් සෝමරත්න මයා සේවයෙන් ඉවත් වි ඇති අතර, එම මහතා විසින් ඔහුට හිමි පාරිතෝෂික මුදලින් ඔහු විසින් ගෙවියයුතු මුදල් අඩුකර ගන්න ලෙස දන්වා ඇති අතර ඒ අනුව පාරිතෝෂික මුදල දක්වා ණය මුදල් අඩුකරගෙන ඇත. | |
| (ඌ) පොල් ආශ්‍රිත කර්මාන්ත මඟින් අධිකාරිය වෙත සිදුකළ යුතු ගෙවීම් Payment Gateway හරහා සිදු කිරීමට 603/09/2022 මැයි 25 දිනැති අංක දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත 2022 නොවැම්බර් 23 දින රු.25,000 ක් තැන්පත් කර සෙලාන් බැංකුවේ ගිණුමක් ආරම්භ කර තිබුණද ඒ හරහා කිසිදු ගනුදෙනුවක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් සිදුකර නොතිබීම හේතුවෙන් එම ගිණුම් ඌණ උපයෝජිතව පැවතුණි. | සෙලාන් බැංකුව හරහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද **payment gateway** ක්‍රියාත්මක නොවුණු අතර **2025** වසරේ මෙය මහජන බැංකුව හරහා ක්‍රියාත්මක කිරීමට කටයුතුකර ඇත**.** සෙලාන් බැංකුවේ ගිණුම වසා දැමීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත**.** | නිශ්ක්‍රීය බැංකු ගිණුම් සක්‍රීය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)අධිකාරියේ වර්ග අඩි 1,162 සමන්විත බිම් මහල යොදාගෙන ස්ථාපිත කළ ව්‍යාපාරික සේවා මධ්‍යස්ථානය ස්ථාපිත කිරීම සඳහා රු.4,869,826 ක් වියදම් දරා තිබුණි. දුරකථනය හරහා පාරිභෝගික ගැටළු විසඳීමට ඇමතුම් මධ්‍යස්ථාන ඒකකයක් , පාරිභෝගිකයන්ට වඩා හොඳ සේවාවක් ලබාදීමට දියමන්ති , ප්ලැටිනම් ,රන් ,රිදී සාමාජික කාඩ්පත් හඳුන්වා දීම මඟින් විදේශීය පාරිභෝගිකයන් හඳුනාගැනීමට පාරිභෝගික සත්කාර ඒකකයක් , අධිකාරිය විසින් දේශිය හා ජාත්‍යන්තර පොල් ආශ්‍රිත දත්ත පාරිභෝගිකයන්ට | පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ අපනයන සංගම් විසින් ආරම්භ කිරීමට යෝජිත NCCI ආයතනය සඳහා මාසික කුලී පදනම මත ලබා දීමට අපේක්ෂා කෙරේ. | නිශ්කාර්ය වියදමක් බවට පත් නොවී සැලසුම් කළ ආකාරයට ක්‍රියාත්මක කිරීමට පාලන අධිකාරිය කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ලබා දීමට අළෙවිකරණ බුද්ධි ඒකකයක් ,තත්ත්ව ආරක්ෂණ , සැකසුම් සංවර්ධන හා අළෙවිකරණ අංශවල තොරතුරු ලබාදීම හා තොරතුරු රැස් කිරීමට තොරතුරු තාක්ෂණ ඒකකයක් හා මෙම මධ්‍යස්ථානයේ සියළුම ක්‍රියාකාරකම් සැලසුම් කිරීමට සැලසුම් ඒකකයක් ඇතුළුව ඒකක 5කින් මෙම මධ්‍යස්ථානයේ කටයුතු සිදු කිරීමට අධිකාරිය සැලසුම් කළ ද ඉහත කී කිසිදු කාර්යයක් සමාලෝචිත වර්ෂයේ සිදු කර නොතිබුණි . | | |
| (ආ)කොහු කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා පුහුණු මධ්‍යස්ථානයක් වශයෙන් 2006 වර්ෂයේදී දුන්කන්නාව කොහු සංවර්ධන හා පුහුණු මධ්‍යස්ථානය ආරම්භකර තිබුණද 2023වර්ෂයේ පුහුණු පාඨමාලාවන් එකක් හෝ පවත්වා නොතිබීම, කර්මාන්ත ශාලාවේ පවතින යන්ත්‍ර 18න් 14ක්ම අක්‍රිය තත්ත්වයේ පැවතීම හා ක්‍රියාකාරී මට්ටමේ පවතින යන්ත්‍ර ද අළුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින බැවින් පුහුණු මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණු ඉටු නොවන බවත් පවතින වත්කම් සියල්ල නිශ්කාර්යව දිරායමින් පවතින බවත් නිරීක්ෂණය විය. | දුන්කන්නාව කොහු පර්යේෂණ ආයතනයේ අක්‍රීය තත්ත්වයේ ඇති යන්ත්‍රෝපකරණ නර්ඩ් ආයතනයේ නිලධාරි මහතෙකු මගින් තක්සේරු කරවා ගැනීමට කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් දිගින් දිගටම පසු විපරම් සිදු කරන ලදි. එම තක්සේරු වාර්තාව සකස් කරමින් පවතින බවත් මෙම මස අවසාන සතියේ ලබා දීමට හැකි බවත් දැනුම් දී ඇත. අදාළ වාර්තාවේ නිර්දේශයට අනුව කටයුතු කිරීමට නියමිතව ඇත. | රාජ්‍ය ව්‍යාපාර කාරක සභාවේදීත් මේ පිළිබඳ නිර්දේශයක් ඉදිරිපත් වුවද ඒ සඳහා දීර්ඝ ක්‍රියා පටිපාටියක් අනුගමනය කිරීමට සිදු ව ඇති බැවින් ක්‍රියාකාරීත්වය සඳහා උනන්දු විය යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| (අ)අපනයනය කේන්ද්‍රකරගත් පොල් ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත වෙත සූර්ය පැනල පද්ධති සවිකිරීම සඳහා සහනදායී පොලී අනුපාතිකයක් යටතේ ණය ලබා දීමට 2024 නොවැම්බර් 21 දින පොල් සංවර්ධන අධිකාරිය සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. මේ සඳහා ලියාපදිංචි අයදුම්කරුවන් 13 දෙනෙකු තෝරා ගෙන තිබුණද විගණිත දිනය වූ 2025 අප්‍රේල් 17 දින දක්වා කිසිදු ණය මුදලක් ප්‍රදානය කර නොතිබුණි. | කර්මාන්තකරුවන් හඳුන්වා දෙනු ලබන ලිපිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇති අවබෝධතා ගිවිසුමේ 11 වන වගන්ති ප්‍රකාරව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් සිදු කරනු ඇත.<br>එනම්,<br>• ණයකරුවන්ගේ, දැනට බැංකුව විසින් අනුගමනය කරනු ලබන සුරකුම් ලිපිලේඛණ හා වෙනත් අවශ්‍යතා සපුරා ගැනීම.<br>• ණය කරුවන් සම්බන්ධයෙන් අසාදු ලේඛණ පරීක්ෂා කිරීම. | ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ සීමාවක් සොයා බලා අත්‍යවශ්‍ය තත්ත්වයන් යටතේ සීමා ඉවත් කිරීමට පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | • ණය අයකර ගැනීම් සම්බන්ධ නීතිමය පියවරයන් ගැනීම.<br>යන කටයුතු සිදු කිරීමෙන් පසු, ණය මුදල් නිදහස් කිරීමට පෙර අධිකාරිය දැනුවත් කරන බවට දන්වා ඇත. | |
| (ආ)කප්රුක ණය යෝජනා ක්‍රමය යටතේ 2023 වර්ෂයේදී රු.112,550,000 ක් ණය නිකුත් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ලබා දී තිබූ ණය ප්‍රමාණය රු.58,658,000 ක් වීම හේතුවෙන් ණය නිකුත් කිරීම 48 % දක්වා අඩු වීමක් වශයෙන් නිරීක්ෂණය විය. | මෙම අයදුම්පත් අතරින් නව කර්මාන්ත ආරම්භය සඳහා ණය මුදල් ඉල්ලුම් කරන අයදුම්කරුවන් ප්‍රතික්ෂේප විය. විෂ සහිත පොල් තෙල් වෙළඳපොලට නිකුත් වීමත් සමඟ කප්රුක ජය ඉසුර ණය යෝජනා ක්‍රමයට අදාල කමිටුව විසින් පොල්තෙල් කර්මාන්ත සඳහා ණය මුදල් ලබා දීමේදී යන්ත්‍ර ස්ථාපිත කිරීම වෙනුවෙන් ප්‍රමුඛතාවය දක්වන ලදී.<br>තවද, ගිණුමේ පවත්වාගත යුතු මුදල වන මිලියන 200 මුදල ඉක්මවා ගොස් ඇති බැවින්, තාවකාලිකව මාස කිහිපයක් ණය මුදල් ලබා දිම නවතා තැබීමට සිදුවිය. (2024 සැප්තැම්බර් මස සිට 2025 පෙබරවාරි දක්වා) එහිදි කර්මාන්තකරුවන් ගෙවන වාරික හේතුවෙන් ගිණුමේ මුදල් ප්‍රමාණය වැඩි වීමත් සමඟ නැවත ණය ලබාදීම ආරම්භ කරන ලදි. | කර්මාන්තකරුවන්ට ණය ලබාදීමටත්, එම ණය අයකර ගැනීමටත් අධිකාරිය කාර්යක්ෂම ක්‍රමෝපායන් සකස් කර ක්‍රියාත්මක කළ යුතුයි. |